**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකය - 2017**

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2640-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ (iv) ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සහ දකුණු ප්‍රදේශය අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,530.80 කට සමාන එජඩො මිලියන 27.16 ක් වන අතර, ඉන් රු.මිලියන 3,172 කට සමාන එජඩො මිලියන 24.40 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ඔක්තෝබර් 22 දින ආරම්භ කරන ලද අතර, 2015 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘති කාර්යයන් නිමකිරීමේ දිනය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා

විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

---------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 24.40 | 3,172.00 | 190.72 | 1.13 | 128.58 | 26.51 | 2,942.80 |
| ශ්‍රීලංර | 2.76 | 358.80 | 21.59 | 0.23 | 21.25 | 3.15 | 349.17 |
| එකතුව | 27.16 | 3,530.80 | 212.31 | 1.36 | 149.83 | 29.66 | 3,291.97 |

## 3.2 භෞතික ප්‍රගතිය

--------------------

උතුරු පළාතේ පළාත් මාර්ග 25 ක කිලෝමීටර් 153.31 ක් පුනරුත්ථාපනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබූ අතර කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, කිලෝමීටර් 147.65 ක පුනරුත්ථාපන වැඩ නිම කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලි කිරීමට අනුව, මාන්කුලම් - මරදමඩු - මින්ගෙනට්ටිගම මාර්ගයේ කිලෝමීටර් 5.66 ක පුනරුත්ථාපන වැඩ ද්‍රව්‍ය ඌනතාවය හේතුවෙන් අත්හැර දැමීමට තීරණය කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ 06 ක් යටතේ මාර්ග 20 ක පුනරුත්ථාපන වැඩ ප්‍රවේශ පහසුකම් නොමැති වීම හා පාරිසරික ගැටලු ආදිය හේතුවෙන් මාස 08 සිට මාස 22 දක්වා වූ ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. තවද, පුනරුත්ථාපන වැඩ පිළිබඳ රු.මිලියන 2,888 ක් වූ ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,963 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර ව්‍යාපෘතියේ කටයුතු වසා දමන අවස්ථාව වන විට රු.මිලියන 2,772 ක මුදලක් දරා තිබුණි.

## 3.4 ව්‍යාපෘතියේ කටයුතු වසා දැමීම

------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු 2017 මාර්තු 31 දිනට වසා දමා තිබුණද, වසා දැමීමේ කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘති නියාමන ඒකකයට නිකුත් කර නොතිබුණි.